# කොළඹ විශ්ව විද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය- පළමු සෙමෙස්තරය 2017/2018

## PSC 3148-දේශපාලන සහ සමාජ න්‍යාය 1

## කාලය පැ 02 යි

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න

සෑම පිළිතුරකට ම උපරිම ව ලකුණු විස්සක් (20) ලැබේ

---

(1) සාමාජවිද්‍යා අධ්‍යයනයේ ක්‍රමවේදාත්මක දිශානතිය ගැන ඔගස්ට් කොම්තේ දැක්වූ අදහස් මොනවාදැයි පැහැදිලි කරන්න.

(2) ඉතිහාසය මුළුල්ලේ සිදු වූ මානව දැනුමෙහි විකාශනය පිළිබඳ ඔගස්ට් කොම්තේ ඉදිරිපත් කළ විග්‍රහය විභාග කරන්න.

(3) (අ) එමිල් ඩර්ක්හයිම් සමාජ සාධක යන්නෙන් අදහස් කළේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(ආ) යාන්ත්‍රික සහයෝගීතාවක සිට ඓන්ද්‍රිය සහයෝගිතාවක් දක්වා වූ සමාජ පරිවර්තනය පිළිබඳ ඩර්ක්හයිම් ගේ මූලික අභ්‍යුපගමන හඳුන්වන්න.

(4) 19 වන සියවස අග භාගයෙහි බටහිර යුරෝපය තුළ සිය දිවි නසා ගැනීම පිළිබඳ එමිල් ඩර්ක්හයිම් කළ දිගු අධ්‍යයනයේ සොයා ගැනීම් පැහැදිලි කරන්න.

(5) ධනේශ්වර සමාජ සම්බන්ධතා පිළිබඳ කාල් මාක්ස් ගේ විවේචනයේ ප්‍රධාන පැතිමාන මොනවාදැයි විශ්ලේෂණය කරන්න.

(6) නවීන ධනේශ්වර සමාජයන්හි තාර්කණීකරනය සහ නිලධරතන්ත්‍රය ගැන මැක්ස් වෙබර් ගේ පැහැදිලි කිරීම විවේචනාත්මක ව විශ්ලේෂණය කරන්න.

(7) ධනවාදයේ පැනනැගීම ගැන කාල් මාක්ස් ගේ සහ මැක්ස් වෙබර් ගේ න්‍යායන්හි සම අසමතා සංසන්දනය කරන්න.